**සීමාසහිත ජාතික කඩදාසි සමාගම - 2015/2016**
**-----------------------------------------------------------**

සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබද ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 ව්‍යාවනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම නිසා, විගණන මතයක් ප්‍රකාශ කිරීමට හැකි පදනමක් ලබා ගැනීමට සුදුසු ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි මට ලබාගත නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් පල නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 58 වන ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හඳුනා ගත යුතු වුවද එකතු වටිනාකම රු. 132,274,693 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු ශේෂයන් නොමැති බවට මහජන බැංකුව තහවුරු කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශනයේ දිගු කාලීන ආයෝජන යටතේ මහජන බැංකුවේ සෘණ ස්ථාවර තැන්පතුවක් ලෙස රු. 2,734,584 ක් හඳුනාගෙන තිබුණි.

ආ සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන ක්‍රියාවලීන් සිදු වී නොමැති බවට සමාගම තහවුරු කර තිබුණ ද එකතු වටිනාකම රු. 14,460,469 ක් නිෂ්පාදන පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශන හි හඳුනාගෙන තිබුණි.

ඇ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු බැරකම රු.45,549,485 ක් වුවද එම දෙපාර්තමේන්තුවේ සෘජු සනාථ කිරීම් අනුව එය රු. 132,302,377 ක් විය. වෙනස වූ රු. 86,752,892 ක් පිළිබඳව සැසඳුමක් මඟින් හෝ කිසිදු අයුරකින් තහවුරු කිරීමට කළමණාකාරීත්වය අපොහොසත් වී තිබුණි.

### 2.2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ ප්‍රධාන ආදායම ලෙස හඳුනාගෙන ඇති එකතු වටිනාකම රු. 6,074,415 සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය විකුණුම් ඉන්වොයිසි පත් හා ලදුපත් සහ ගැණුම් පිරිවැය වන රු. 3,577,369 සනාථ කිරීමට අවශ්‍ය ගැනුම් ඉන්වොයිසි පත් නොතිබුණි.

ආ වටිනාකම රු. 128,150,572 ක් වූ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන , රු.34,260,504 වූ අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන සහ රු.94,442,882 ක් වූ ප්‍රධාන කාර්යාලයෙන් ලද ප්‍රදාන සනාථ කිරීමට අවශ්‍ය ලදුපත් සහ ප්‍රදාන ලැබීම් මූලාශ්‍ර ලියවිලි නොතිබුණි.

ඇ රු.54,475,280 ක් වූ සේවක අර්ථසාධක අරමුදල සඳහා උපචිත දායක වීම සහ අධිභාර , රු.3,642,525 ක් වූ සේවක භාරකාර අරමුදල සඳහා දායක වීම සනාථ කිරීමට අවශ්‍ය වැටුප් ලේඛන , ප්‍රේෂණ පත්‍ර සහ දායකත්වය ගණනය කිරීමේ ලේඛනය නොතිබුණි.

ඈ රු.11,082,941 ක් වූ උපචිත කුලී සහ රු. 26,281,819 ක් වූ උපචිත වැටුප් හා වේතන සනාථ කිරීමට අවශ්‍ය බදු කුලී ගිවිසුම් සහ මාසික වැටුප් ලේඛන නොතිබුණි.

ඉ රු.146,388,237 ක් වූ වෙළඳ ණයගිමියන් සහ රු.27,566,297 ක් වූ විවිධ ණයහිමියෝ (අස්කොන් කඩදාසි ) සනාථ කිරීමට අවශ්‍ය පාලන ගිණුම්, ණයහිමි ලෙජරය සහ සෘජු ශේෂ සනාථ කිරීම් නොතිබුණි.

ඊ රු.839,300,644 ක් වූ දේපළ පිරියත උපකරණ සනාථ කිරීමට අවශ්‍ය යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, දේපළ ඔප්පු, මෝටර්රථ ලියාපදිංචි සහතික නොතිබුණි.

උ රු. 121,481,914 ක් වූ අවසන් තොගය සනාථ කිරීමට අවශ්‍ය තොග ගණනය කල වාර්තා සහ තොග ලේඛන නොතිබුණි.

ඍ රු.389,715,930 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ සනාථ කිරීමට අවශ්‍ය සෘජු ශේෂ සනාථ කිරීම් සහ පාලන ගිණුම් නොතිබුණි.

එ රු. 231,282,413 ක් වූ ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු අධිභාර සඳහා වෙන්කිරීම සනාථ කිරීමට අවශ්‍ය අධිභාර අයකිරීමේ නිවේදනය සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ හුවමාරු වූ ලිපි. නොතිබුණි.

ඒ රු. 467,972,042 ක් වූ ඔස් ලංකා (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු ශේෂය සනාථ කිරීමට අවශ්‍ය බඳු ගිවිසුම, අදාළ ජනල් සටහන්, රේඛීය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය සමඟ හුවමාරු කරගත් ලිපි නොතිබුණි.

ඔ රු. 161,119,057 ක් වූ පොලී සහිත ණය සම්බන්ධව ණය ගිවිසුම් සහ ණය මුදල් ලබාගැනීම සම්බන්ධ ලිපි සහ ලදුපත් නොතිබුණි.

ඕ වටිනාකම රු. 20,078,680 ක් සඳහා වූ පාරිභෝගික තැන්පතු ලේඛනය නොතිබුණි

ක රු. 14,487,197 ක් වූ මුදල් හා මුදල් සමාන දෑ සනාථ කිරීමට අවශ්‍ය මුදල් පොත, බැංකු සැසඳුම් සහ ශේෂ සනාථ ලිපි නොතිබුණි.

ග වටිනාකම රු. 19,387,340 ක් සඳහා මාසික වැටුප් හා ප්‍රසාද දීමනා ගණනය කිරීම් ලේඛන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 71,610,232 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 123,638,759 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 195,248,991 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් පිරිවැය රු. 226,432,821 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2015 පෙබරවාරි 09 දිනට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට නියමිතව තිබූ හිඟ මුදල වූ රු. 472,210,131 ක මුදල නොගෙවීම නිසා එදින සිට වාලච්චේන කර්මාන්තශාලාවට ලබාදෙන විදුලිය තාවකාලිකව විසන්ධි කර තිබුණි. විදුලි සැපයුම නොමැති නිසා එදින සිට වාලච්චේන කර්මාන්ත ශාලාවේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවක් සිදුවී නොතිබුණි.

**5 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ 2015/2016 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර 2022 ජූලි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.